## රාජකීය විද්‍යාලය - කොළඹ 7

## දෙවන වාර පරීක්ෂණය 2008 - 10 ශ්‍රේණිය

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I

**කාලය පැය 1**

**උපදෙස්**

*** සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. අවශ්‍යතා හා වුවමනා අතර නිවැරදි සම්බන්ධතාව ඇති භාණ්ඩය තෝරන්න.
   1) ආහාර - නිවාස  2) ඇඳුම් - විලාසිතා
   3) නිවාස - තට්ටු ගෙවල්  4) සෞඛ්‍ය - අධ්‍යාපනය

2. භාණ්ඩයක් සතු සුවිශේෂ ලක්ෂණ වන්නේ,
   1) ද්‍රව්‍යාත්මක පැවැත්ම  2) අස්පෘශ්‍ය වීම
   3) දෘෂ්‍යමාන බව  4) උපයෝගීතාවක් තිබීම

3. නිෂ්පාදනයේ මූලිකාංග වන්නේ,
   1) යෙදවුම්  2) ක්‍රියාවලිය
   3) නිමැවුම්  4) ඉහත සියල්ලම

4. එළවළු හා පළතුරු බෙද හැරීමට යෝග්‍ය ක්‍රමය වන්නේ,
   1) ඍජු අලෙවිය  2) සිල්ලර වෙළෙඳුන් මඟින්
   3) තොග වෙළෙඳුන් මඟින්  4) නියෝජිතයන් මඟින්

5. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් නිරීක්ෂණය කිරීමට "සාරගම" පාසලේ ගුරුතුමිය ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කර ඇත. ඔබ එයට සහභාගී වන්නේ නම් එහි දී දැකගත හැකි විශේෂ ලක්ෂණය වන්නේ,
   1) ශ්‍රම විභජනය  2) කාර්ය විශේෂිකරණය
   3) විශේෂ ප්‍රාගුණ්‍ය  4) ඉහත සියල්ලටම

6. ස්වයං පරිභොජන නිෂ්පාදනය බිඳ වැටී භාණ්ඩ හුවමාරු ක්‍රමයට හුරුවීමට හේතුව වන්නේ,
   1) තමාට අවශ්‍ය සියල්ල තමාටම නිපදවා ගැනීම නොහැකි වූ නිසාය.
   2) අතිරික්ත නිෂ්පාදන හුවමාරු කරගැනීමේ අවශ්‍යතාව නිසාය.
   3) එක් අයෙකුට සෑම දෙයක්ම නිෂ්පාදන කිරීමට කාලය නොතිබීම නිසාය.
   4) ඉහත සියල්ලම නිසාය.

7. වළං හැදීමේදී නිපුණයකු වූ පිංගාමී මාමාට තමා තැනූ වළං දී, ඒ වෙනුවට වී මල්ලක් ලබා ගැනීමට අවශ්‍ය ව ඇත. වී ගොවියකු වූ සියාතුට අවශ්‍ය වනුයේ හරකෙකි. භාණ්ඩ හුවමාරුවේදී මොවුන් මුහුණ පාන ගැටළුව වන්නේ,

1) වුවමනා අතර ද්වීක සමපාතයක් නොවීම

2) භාණ්ඩ වල වටිනාකම මැනීමේ දුෂ්කරතාව

3) ගෙන යාමේ අපහසුව

4) ඉහත සියල්ලම

8. අද පවතින නූතන ආර්ථික දමයට පදනම වැටුනේ,

1) භාණ්ඩ හුවමාරුවය
2) මුදල් භාවිතය නිසාය
3) ඉලෙක්ට්‍රොනික වාණිජ්‍ය නිසාය
4) ඉලෙක්ට්‍රොනික මුදල් භාවිතය නිසාය

9. හොඳ මුදලක තිබෙන ප්‍රධානම ලක්ෂණය වන්නේ,

1) කල් පවත්නා බව
2) කොටස් කල හැකි වීම
3) ප්‍රජාවගේ පිළිගැනීම
4) සුලභ හෝ දුලබ නොවීම

10. කාර්මික විප්ලවය නිසා නිෂ්පාදන ක්ෂේත්‍රයේ සිදුවූ වැදගත් වෙනස වන්නේ,

1) මහා පරිමාණ නිෂ්පාදන බිහිවීම
2) යන්ත්‍ර සූත්‍ර භාවිතය
3) තොරතුරු හුවමාරුව වේගවත් වීම.
4) ගෘහ කර්මාන්ත බිඳ වැටීම

11. වාණිජ්‍ය යනු

1) වෙළෙඳාම
2) උපකාරක සේවා
3) වෙළෙඳාම හා උපකාර සේවා
4) සන්නිවේදනය

12. වාණිජ්‍යයේ දී උපකාරක සේවාවක් ලෙස නොසැලකෙන්නේ

1) ප්‍රවාහන
2) රක්ෂණය
3) වෙළෙඳාම
4) මුදල් හා බැංකු

13. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුවක් සමඟ ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් වන්නේ,

1) ඉලෙක්ට්‍රොනික මුදල් බිහිවීම
2) ඉලෙක්ට්‍රොනික වාණිජ කටයුතු
3) අන්තර්ජාල භාවිතය
4) ඉහත සියල්ලම

14. ව්‍යාපාරයක ගණුදෙනුකරුවන් අයත් වන්නේ කිනම් පරිසර සාධකයටද?

1) අභ්‍යන්තර පරිසරයට
2) බාහිර පරිසරයට
3) සමාජ හා සංස්කෘතික පරිසරයට
4) ඉහත සියල්ලටම

15. ව්‍යාපාර සඳහා සීමාකාරී සාධකයක් ලෙස සැලකෙන පරිසර සාධකය වන්නේ,

1) භෞතික හා දේශපාලන පරිසරය 2) සමාජ හා සංස්කෘතික පරිසරය

3) ආර්ථික හා ප්‍රජා පරිසරය 4) ඉහත සියල්ලම

16. ව්‍යාපාර කෙරෙහි උනන්දු වන බාහිර පාර්ශවයක් වන්නේ,

1) අයිතිකරු 2) ගණුදෙනුකරුවෝ

3) කළමනාකරුවෝ 4) ආයෝජකයෝ

17. ව්‍යාපාර ආචාරධර්ම ගැන සැලකිලිමත් වීම ව්‍යාපාරිකයෙක් සතු වන

1) වගකීමකි 2) අයිතිවාසිකමකි 3) යුතුකමකි. 4) වගකීමකි

18. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරවල මූලික පරමාර්ථය වන්නේ,

1) ආර්ථික සුබසිද්ධිය 2) සමාජ ශෝධනය

3) සමාජ සේවය 4) ප්‍රජා සහභාගිත්වය

19. දිනපතා ව්‍යාපාරයේ එකතුවන මුදල් බැංකුවේ තැන්පත් කිරීමට ව්‍යාපාරිකයකු වූ සජිත් කැමැත්තක් දක්වයි. ඔහු එයින් අපේක්ෂා කරන්නේ,

1) මුදලේ ආරක්ෂාව හා ගණුදෙනු පහසුව

2) හදිසි අවස්ථාවක පහසුවෙන් ලබාගත හැකි වීම

3) මුදලේ ආරක්ෂාව

4) මුදලේ ආරක්ෂාව හා අවශ්‍ය අවස්ථාව ලබා ගැනීම

20. ගංවතුර ගැලීම නිසා සිය සිල්ලර වෙළෙඳසැල කිහිප විටක් ම අලාභ හානි සිදුවීම නිසා බියෙන් පසුවන සිරිල්ට එම ආපදාවෙන් මිදීම සඳහා යෝග්‍ය විසඳුම වන්නේ,

1) ව්‍යාපාරය අතහැර දැමීම ය.

2) සුදුසු ස්ථානයකට ව්‍යාපාරය රැගෙන යාමය

3) ස්වභාවික ආපද පිළිබඳ රක්ෂණයක් ලබා ගැනීමය

4) ප්‍රදේශය හැර යාමය.

21. අධික වර්ෂාපතනය නිසා එළවළු වගාව විනාශ වී යාම මේ දිනවල එළවළු මිල ගණන් ඉහළ යාමට හේතු වී ඇතැයි රාවයක් පවතී. එළවළු මිල වැඩිවීමට හේතුව ලෙස ඔබ හඳුනා ගන්නේ,

1) පාරිභෝගික ඉල්ලුම වැඩිවීම 2) එළවළු සැපයුම අඩුවීම

3) ඛණිජ තෙල් මිල ඉහළ යාම 4) ඉහත සියල්ලම

22. ගිණුම්කරණ සේවා සැපයීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන වෘත්තීය ගණකාධිකාරීන් කිහිප දෙනෙකුට යෝග්‍ය ව්‍යාපාරයක් වන්නේ,

1) තනි පුද්ගල ව්‍යාපාරයකි
2) හවුල් ව්‍යාපාරයකි
3) සිමිත පෞද්ගලික සමාගමකි
4) සීමිත පොදු සමාගමකි

23. ජංගම ගිණුමක් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයකු බලාපොරොත්තු වන්නේ,

1) මුදල් ඉතිරි කිරීම
2) චෙක්පත් මගින් ගණුදෙනු කිරීම
3) ණය ලබාගැනීම
4) ඉහත සියල්ලම

24. බැංකු ගණුදෙනු පහසුකර ගැනීම සඳහා යොදගනු ලබන්නේ,

1) ණයපත්
2) හරපත්
3) චෙක්පත්
4) ස්වයංක්‍රීය ටෙලර් කාඩ්පත්

25. ඊ-මේල් භාවිතය ප්‍රචලිත වීමට හේතුව වන්නේ,

1) වේගවත් බව
2) වියදම් අඩුවීම
3) පහසුව
4) සුලභත්වය

26. යුරෝපිය පොදු වෙළඳපලට අයත් රටවල් භාවිතා කරන මුදල් වර්ගය වන්නේ,

1) ඇමරිකානු ඩොලර්
2) යූරෝ
3) ස්ටර්ලින් පවුම්
4) ඩොයිෂ් මාර්ක්

27. ලෝකයේ දේශ සීමා බාධක බිඳ වැටී එකට වෙළඳ පොළක් බවට පත්විම හඳුන්වන්නේ,

1) විශ්ව ගම්මානය වශයෙනි
2) ගෝලීකරණය ලෙසය
3) ලෝක වෙළඳ පොළ ලෙසය
4) ඉහත සියල්ලටය

28. කේවල ස්වාමී ව්‍යාපාර වඩාත්ම ජනප්‍රිය ව්‍යාපාර සංවිධානය වීමට හේතුව වන්නේ,

1) පහසුවෙන් ඇරඹිය හැකි වීම
2) නීතිමය බලපෑම් අඩුවීමය
3) අඩු සේවක සංඛ්‍යාවක් අවශ්‍ය වීම
4) ණය ලබා ගැනීමේ පහසුව නිසාය

29. හවුල් ව්‍යාපාරයක සාමාජික සංඛ්‍යාව වන්නේ,

1) අවම 1 උපරිම 10
2) අවම 1 උපරිම 20
3) අවම 2 උපරිම 20
4) අවම 2 උපරිම 50

30. 2007 අංක 7 දරණ පනත යටතේ අදල වන්නේ කිනම් ව්‍යාපාර සංවිධානයක් සඳහා ද?

1) කේවල ස්වාමි ව්‍යාපාරය
2) හවුල් ව්‍යාපාරය
3) සීමිත සමාගම්
4) සමූපකාර සමිති

31. "සහන පැළ තවාන" පවත්වා ගෙන යන පාල නැමැත්තා තම ව්‍යාපෘතිය ලියාපදිංචි කල යුත්තේ කුමන පනතක් යටතේද?

1) 1982 අංක 17 දරණ සමාගම් පනත

2) 1972 අංක 05 දරණ සමූපකාර සමිති පනත

3) 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ පනත

4) 2007 අංක 07 දරණ සමාගම් පනත

32. ව්‍යාපාරයක් ආරම්භ කර පුළුල් කිරීමේ අපේක්ෂාව ඇති "සරුබිම" පොහොර නිෂ්පාදන ව්‍යාපාරික ලක්මාල් සිය ගණුදෙනු පහසුකර ගැනීමේ අපේක්ෂාවෙන් ඔබගේ උපදෙස් පතයි. ඔබට දිය හැකි වඩාත් යෝග්‍ය උපදෙස් වන්නේ,

1) උපයන මුදල් තමා සතුව තබා ගැනීම

2) එදිනෙදා එකතුවන මුදල් බැංකුවේ තැන්පත් කිරීම

3) බැංකු ජංගම ගිණුමක් පවත්වා ගැනීම

4) ණය ගැනීම් මඟින් ව්‍යාපාරය පුළුල් කිරීම

33. කුඩා පරිමාණයේ කෘෂිකාර්මිකයකු වන පියසේන තම ගෙවත්තේ එළවළු හා පළතුරු වගා කරයි සිය පරිභොජනයට වඩා අතිරික්ත නිෂ්පාදනයක් ඔහු සතුව පවතී. ඔහු ඒ සඳහා ගතයුතු යෝග්‍ය පියවර වන්නේ,

1) අතිරික්ත නිෂ්පාදනය රැස්කර තබා ගැනීම

2) අනිත් අය සමග හුවමාරු කර ගැනීම

3) තම නිවස අසල තබා ගැනීම

4) වෙළෙඳ සැලකට විකුණා මුදල් ලබාගැනීම

34. භාණ්ඩවල මිල වැඩිවීම නිසා ඇතිවන අනිවාර්ය ප්‍රතිවිපාකය වන්නේ,

1) ජීවන වියදම වැඩිවීම

2) ජීවන තත්වය පහත වැටීම

3) උද්ධමනය වැඩිවීම

4) මුදලේ අගය අඩුවීම

35. පාරිභොගික ආරක්ෂාව පිළිබඳව කටයුතු කිරීමේ බලතල හිමි ආයතන කුමක්ද?

1) ප්‍රමිති ආයතනය

2) පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය

3) මධ්‍යම පරිසර අධිකාරිය

4) ඉහත සියල්ලටම

36. සමූපකාර සමිති සුවිශේෂ ව්‍යාපාර සංවිධානයක් වන්නේ

1) අයිතිය සාමාජිකයන් සතු වීමයි

2) රාජ්‍ය අනුග්‍රහය ලැබීම නිසාය

2) ලාභය බෙදීමක් නොකරන නිසාය

4) ඉහත සියල්ලටම නිසාය

37. අන්තර් බැංකු ක්‍රමයෙන් ගණුදෙනු කරුවාට ඇති වාසිය වන්නේ.

1) ඉතිරි කිරීමේ පහසුව
2) ණය ලබාගැනීමේ පහසුව
2) ගණුදෙනු පහසුව
4) ඉහත සියල්ල

38. ව්‍යාපාර සැලැස්මක් ව්‍යාපාරයකට වැදගත් වන්නේ,

1) දක්මක් ඇතිකර ගැනීමය
2) මෙහෙවර ප්‍රකාශ කිරීමට
3) ණය ලබා ගැනීමට
4) පිරිවැය ගණනය කිරීමට

39. ගණුදෙනු පොත්පත් වල සටහන් කර තබා ගැනීමට ව්‍යාපාරිකයන් උනන්දු වන්නේ,

1) ලාභ පාඩු බැලීමට
2) මතක තබා ගැනීමට
3) ණය ගනුදෙනු පහසුවට
4) ඉහත සියල්ලටම

40. පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයට නූතන ව්‍යාපාරවල අවධානය යොමු වී ඇත්තේ,

1) අඩු සේවක සංඛ්‍යාවක් අවශ්‍ය නිසාය
2) පරිගණක භාවිතය වැඩි වීම නිසාය
3) පහසු හා වේගවත් බව නිසාය
4) නිවැරදි හා ඉක්මනින් තොරතුරු ලබාගත හැකි නිසාය